# ලාහෝර් පෙම්වතිය

**තිලකසිරි ඒකනායක**



මා සිටි කාමරයට පැමිණි ක්‍රිෂ්ණන් ඉතාම ශෝකී මුහුණින් මගේ අත මිරිකා ගත්තේය . ඔහුට  පිටුපසින් පැමිණියේ මොබින්ය. මුන් දෙන්නාම අධික ශෝකයකින් හෙම්බත් වී සිටියහ. එදා 2009 අවුරුද්දේ මාර්තු හතර වැනිදාය. මොබින් මා වැළඳගෙනි මගේ බලවත් ශෝකය, අපට සමා වෙයනී කීවේය.

මේ සිදුවන්නේ මොන හරුපයක්දැයි නොදන්නා මම තුෂ්නිම්බූතවී බලා සිටියෙමි. මගේ වික්ෂිප්ත මුහුණ දෙස බලාගෙන

ක්‍රිෂ්ණන් කිව්වේ ශ්‍රී ලංකා  ක්‍රිකට් ටීම් එකට ලාහෝර්වලදී ප්‍රහාරයක් එල්ල කර ඇති බවයි.

ක්‍රිකට් පිස්සන් දෙදෙනෙකු වන මේ දෙන්නා තමන්ගේ කණ්ඩායමටත් වඩා ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමට ආදරය කලෝය.

ක්‍රිෂ්ණන් කේරළයකු වූ අතර මොබින් පකිස්තානයේ අති දුෂ්කර ගමක ඉපිද අහම්බෙන් නගරයට ආ අයෙකි.  මේ දෙදෙනා අඹ යහළුවන් වූහ. කෑවේ බිව්වේ ගමන් බිමන් ගියේ එකටමය.

එදා ඒ සිද්දියෙන් පසු ක්‍රිෂ්ණන්ටත් වඩා මොබින් මගේ හිතවතෙකු විය. සිය ප්‍රේම කතා, ගමේ කතා හා  පවුලේ කතා ඉඩක් ලැබුණු හැටියේ මා ඉදිරියේ තළුමරමින් කියෙව්වේ අංග චලනයෙන්ද රස එක්කාසු කරමිනි .

"උඹ දන්නවද අපේ ගම තියෙන්නේ අන්ත දුෂ්කර පැත්තක. ලාහෝර්වල ඉඳන් කිලෝමීටර් දෙසීයකට වැඩියි . ගමට ඇතුළු වෙන්න පුළුවන් එක තැනකින් විතරයි. අනිත් හැම පැත්තම ගිරි දුර්ග.
ගමට ඇතුලුවෙන තැන පොඩි අම්බලමක් තියෙනවා. මේකේ ඕනි වෙලාවක අලූත් වතුර සෙම්බුවක් මැටි කෝප්පෙකින් වහල තියෙනවා.  පිටස්තරයෙකුට එන්න පුළුවන් අන්තිම පොයින්ට් එක තමයි මේ අම්බලම□ .

"ඉතින් ගමට අමුත්තෙක්  අවොත් ?"

"අම්බලමේ නවතින්න ඕනි. අම්බලමට මාසෙන් මාසෙට බාරකාරයෙක්  දානව. ඔහු වරින්වර ගිහින් වතුර පිංතාලිය පුරවන්න ඕනි අමුත්තෙක් ඇවිල්ලනම් කෑම බීම දීල එයා බැහැ දකින්න ආපු ගම්වැසියට පණිවිඩේ කියන්න ඕනී."

"ඊට පස්සේ ගමේ මනුස්සයා ඇවිල්ල අමුත්තා එක්කරගෙන යනවද ?"

"මොන . එයා ඇවිල්ල අම්බලමේ ඉඳන්ම කතාබහ කරලා අමුත්තා පිටත් කරන්න ඕනි . ගමට කිසිම පිටස්තරයෙකුට ඇතුළු වෙන්න බෑ .

"එතකොට අල්ලපු ගම්වල නෑදෑයෝ යන්නේ එන්නේ නැද්ද?"

"නෑ එහෙම නෑදෑකම් ගැන අහල නෑ"

"ගමට  පොලිසියෙන් එහෙමවත්  එන්නේ නැද්ද ?"

"නෑ පොලිසියට එන්නත් බෑ . එන්න උත්සහ කරලත් නෑ ."

"මටනම් විශ්වාස කරන්නත් බෑ ."

"උඹට මං කියන දේ විශ්වාස කරන්නම වෙනවා. මොකද මම උඹ අපේ ගමට එක්කරගෙන ගිහින් පෙන්නන්න කියලයැ ". කියමින් ඔහු සිනාසුනේය. ඉන්පසු ඔහු බැරෑරුම් මූණක් ඇතිව ටික වෙලාවක් කල්පනා කළේය .

"දවසක් හරිම දුක හිතෙන දෙයක් සිද්ද වුනා. දැන්නම් මතක්වෙනකොටත්  හරි කාලකන්නි කමක් දැනෙනවා"

"කැමතිනම් කියපන්□ . මම කිව්වෙමි"

"මෙහෙමයි අපේ ගමේ ලස්සනම ලස්සන කෙල්ලෙක් හිටියා. මම ජීවිතේටම දැකලා නෑ ඒ වගේ ලස්සන වෙන කෙනෙක් . මේ කෙල්ල අල්ලපු ගමේ කොල්ලෙක් එක්ක යාලූ වුනා"

"ඒක මහා පුදුම කතාවක්නේ□ . මම කියද්දී ඔහු කිව්වේ "ඒක පුදුම ආදර කතාවක්" කියලාය   .

"මුන් දෙන්නා කොහේදී මුණ ගැහුනද කොහේදී ආදරේ කරාද අර මනුස්සයා ආවේ ගියේ කොහොමද හිතා ගන්නත් බෑ"

"ඉතිං"

"ඉතින් මොකද කරන්නේ ගමේ  කොල්ලෝ ටික මග රැක ඉඳල මහා පාන්දරක කොල්ලට ගහල එලෙව්වා . එදායින් පස්සේ ආයේ පැත්ත පළාතේ ආවේ නෑ. මිනිහ අතුරුදහන් වුනා" . ඔහු සුසුමක් හෙලීය .

"මට දුක ඒ ගමනට මමත් ගිය එක"

මම ගොළුව බලා හිටියෙමි.

ඉන් ටික දවසක් යනතුරු ඔහු මගේ මුහුණ බලා කතා කරේ නැත .ඔහු කීවේ ගෙතූ කතාවක් යැයි සිතන්නට මම උත්සහ කළෙමි. ඇරත් එහෙම හිතන එක ඔහු දකිද්දී  මට සහනයක් ගෙන දුන්නේය.

ඔහු පසුව මගේ හිත හදන්නට මෙන් මෙසේ කිව්වේය.

"අර ගමන මම ගියාට අපට ඉස්සරහින් තව කොල්ලෝ කට්ටියක්  ගියා . ඒගොල්ලෝ තමයි ගැහුවා  කිව්වේ .ඇත්තද බොරුද මම දන්නේ නෑ

"ඒත් මට එක දෙයක් කියපන් " මම මොබින්ගෙන් පසු දිනක ඇසුවෙමි.

"අර කෙල්ල ගැන උඹේ හිතෙත් ආදරයක් තිබ්බ නේද ?"

ඊට උත්තරයක්  නොදී මා මග හැර  ගිය මොබින් ඉන් සෑහෙන දිනකට පසුව මට මෙහෙම කිව්වේය   .
"සමහර විට අපේ ගමේ ගොඩක් කොල්ලෝ වගේ මමත් ඈට ආදරේ කරන්න ඇති. ඒත් අර සිද්දියෙන් පස්සේ මට ගම එපා වුනා . එහෙන් පිටමන් වෙලා ආවේත් ඒකමයි."

මගේ සිතේ  චිත්‍රපටියක මෙන් ඒ සිද්දියේ අතුරු කතා වරින්වර මැවී බොඳවී ගියේය . මමද  ඒ නොදන්නා දුර්ඝයකට වී වියෝ දුකින් වැලපෙන සුන්දර තරුණිය ගැන සිතන්නට සෑහෙන කාලයක් වැය කරන්නට ඇත .සමහර විට මොබින්ටත් වඩා මම ඈට පෙම් කරා වන්නටද පුළුවන .

http://thilakasitha.blogspot.com.au/

LA TROBE TAXATION SERVICES
Your friendly tax accountants



La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.

La Trobe Taxation Services
Registered Tax Agent
(ABN 67 251 931 300)

CONTACT
Bundoora:
Mala: - 0401000421 or 03-94708241
Cranbourne:
Janaka:- 0403728635 or 03-87868033

Email: latrobetax@yahoo.com.au

www.latrobetax.com.au